

නිකොලායි බග්දානව්

# සුහද සිනාව

## නිකොලායි බග්දානව්

# සුහද සිනාව

අනුවාදය
දැදිගම වි. රැද්‍රිගු

චිත්‍ර
ඉ. උෂකොව්

සී/ස, ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂිං හවුස් (පුද්) සමාගම



# ප්‍රධාන මිනිසා

වලෝද්‍යා උල්යානොව් අන් හැම ළමයකු වගේ ම, 'ඉතා ම විශාල එක්කෙනා කවුද? ඉතා ම ශක්තිමත් එක්කෙනා කවුද? ලෝකයේ උසස් ම එක්කෙනා කවුද?' කියලා කල්පනා කරන්න පටන් ගත්තා.

ඔහු ආශා කළේ සෑම කරුණක් ම තනිව ම දැන ගැනීමට ය. වැඩි ම ශක්තියක් ඇති සතා අශ්වයා බව ඔහු දැන ගත්තා. අශ්වයාව ගැලට බැන්දා ම ඌ තාත්තයි, අම්මයි, අයියලයි, අක්කලයි, මල්ලිලයි, ඔහුයි වාඩි වෙලා ඉන්න ගැල ඇදගෙන දුවනවා. අස්රිය කරුවා රේන්ස් පටි ඇදලා කෑ ගහනවා: "ඉතින් දුවපිය!" අශ්වයා රියත් ඇදගෙන දුවනවා. ඉතින් එයා තමයි ප්‍රධානියා.


දවසක් දා සර්කස් ක්‍රීඩාව බැලීමට වලෝද්‍යා ගියා. ලෝකයේ ඉන්න ලොකු ම සතා ඇතා බව ඔහු එහි දී දුටුවා. ඇතා කන්දක් තරම් විශාලයි. උගේ පිට උඩ පුංචි ගෙයකි. ඒ ගෙයි වඳුරන් හිටියා. වඳුරන්ට ලස්සන ඇඳුම් අන්දවා තිබුණා. ඒ ගොල්ලන්ගේ ලොක්කා තමයි කවටයා. ඇතා එයාගේ විශාල හොඬෙන් කවටයාව ඔසවා ඇද ගෙන ගියා. සර්කස් බැලීමට පැමිණි සියලු දෙනා සහ වලෝද්‍යා බොහොම සතුටින් හිනා වුණා. කවටයා ලොක්කා නොවේ.

නැව ඇතාටත් වඩා ලොකු බව ඉක්මනින් වලෝද්යා දැන ගත්තා. එය ගොඩබිම දුවන්නේ නැහැ. විශාල ගංගා තරණය කරනවා. තාරාවා තටු ගහනවාට වඩා වැඩි වේගයෙන් නැවේ රෝද කරකැවෙනවා. ඇතාටත් වඩා හයියෙන් හඬ නගනවා.

ගං තෙරට පැමිණි එක් නැවක් කොතරම් උස් හඬින් හඬ නැගුවේද යත් අසල හිටපු අශ්වයෝ පවා බිය වුණා. එහෙත් වලෝද්යා බිය වුණේ නැහැ. ඔහු සමග කිසි දෙයකට බිය නැති ඔහුගේ අයියා සාෂා හිටියා.

මිනිස්සු නැවට නගින්නට පටන් ගත්තා. නැවට ඉවසුමක් නැතුවාවගේ හූ හඬ තැබුවා. ඒ නිසා දෙකන් වසා ගැනීමට පවා මිනිසුන්ට සිද්ද වුණා. ඒ නැව තව පොඩ්ඩෙන් මුළු නගරය ම ඇද ගෙන යනවා. ගොඩ බිම ලොකු කණුවකට බැඳලා තිබුණ නැවේ කඹය ලිහා දැමීමට අමතක වෙලා. ගං තොටුපොළ දෙදරුම් කෑවා. මිනිස්සු ඒ මේ අත දුවලා කෑ ගහන්නට වුණා. නාවිකයෝ කඹය ලිහා දැම්මා. නැව නගරය ඇදගෙන ගියේ නැතුව තනිව ම යාත්‍රා කළා.

හැම දෙයක් ම යසට සිදු වීම නිසා මිනිස්සු බොහොම සතුටු වුණා. ඔවුන් ඔවුන් දෙස බලා ලේන්සු වනමින් සමුගන්නටත්, සතුටු සිනා පාන්නටත් පටන් ගත්තා. අන් සමහරු කඳුළු වැගුරුවා.



නැව විශාලයි. එහි කාමර බොහෝමයක් තියෙනවා. ඒවායෙහි වාඩි වීමත්, ලොකු සමවාරයකින් තේ බීමටත් පුළුවනි. සීනි, පාන්, බනිස් සහ ජෑම් සමග බොහෝ දෙනෙක් තේ බීවා.

වලෝද්යාගේ අම්මා තේ වත් කළා. තාත්තා පුවත්පත කියවන්නට වුණා. වලෝද්යා දඟ කරයි කියලා ආන්නා අක්කා ඔහු ගැන සෝදිසියෙන් හිටියා. බොහොම පාළු ගතියක් පවා දැනෙනවා.

රිදී හැන්ද තේ විදුරුවට යන්තමින් හැප්පෙන විට ටිං-ටිං යන හඬක් පිටවෙනවා. නැවේ යන්ත්‍රවල හඬ නිසා ඩෙක් තට්ටුවත් දෙදරුම් කෑවා.

පවුලේ සියලු දෙනා ම තේ බොන විට, වලෝද්යා සෝපාවෙන් ඈත් වෙලා නැව හුස්ම ගන්නා හැටි සවන් දුන්නා. නැව ඇතුළේ මිනිහකුගේ වගේ යමක් සෙලවෙනවා. නැව සිදුරු කරලා බලන්නට පුළුවන් නම් හොඳයි කියලා ඔහුට හිතුණා. දවසක් දා ඔහු සෙල්ලම් අශ්වයකු සිදුරු කරලා බැලුවා. ඒක ඇතුළේ ලී කුඩු විතරයි තිබුණේ. වලෝද්යා මෙහෙම කල්පනා කරන්නට පටන් ගත්තා. නැව ඇතුළේ සද්ද කරන දේ දැන ගන්නේ කොහොම ද?

"මල්ලී හොයන්නේ මොනවා ද?" අයියා ඇහුවා.

වලෝද්යා අයියාගේ පපුවට කනක් තියලා ඇහුවා: ටක්-ටක් ගාලා හදවත ගැහෙනවා.

"එය තමයි හෘදය වස්තුව" එසේ කී අයියා මල්ලී සිතන්නේ මොනවා ගැන ද යන්න දැන ගත්තා. "නැවේ හඬ නගන්නේ යන්ත්‍රය ය."

යන්ත්‍රය. වලෝද්යාට ඒ යන්ත්‍රය බැලීමට ලොකු ආශාවක් ඇති වුණා.

ඔහු කීප වරක් ම නැවේ කුටියේ ඉඳලා ඩෙක් තට්ටුවට ගියා. එවිට ඔහුගේ අක්කා සහ නංගිලා ඔහුට මග අහුරා මෙහෙම කීවා. "කලබල නොවී සන්සුන් වෙලා ඉන්න!"

යන්ත්‍රයේ ශබ්දය සහ උණුසුම් වාතය ඇති වන තැන තිබුණ යකඩ දොර දක්වා වරක් වලෝද්යා දුවලා ගියා. ඔහු යකඩ ඉණි මග දිගේ යන්ත්‍රාගාරයට යන්නට සූදානම් වුණා. නැවේ කපිතන් ඔහුව දැකලා මෙහෙම කීවා.

"යන්ත්‍රාගාරයට යාම තහනම්!"

"මට චුට්ටක් බලන්න ඉඩ දෙන්න!"

"බැහැ, බැහැ! 'ඇතුළු වීම තහනම්' කියන පුවරුව පේනවද? මම පවා යන්ත්‍රාගාරයට යන්නේ නැහැ" කපිතන් එසේ කියා කෑ ගැසී ය: "මේ ළමයා කාගේ ද?"

අක්කා වලෝද්යා අල්ලාගෙන අම්මා වෙත ගෙන ගියා. ඔහුට සිදු වුණා බොහෝ වේලාවක් සෝපාව උඩ වාඩි වී සිටීමට.


රෑ වුණා ම නැවේ සිටිය සියලු දෙනාට ම නිදි මත හැදුණා. වලෝද්‍යා නිදා ගත්තා වගේ ඇස් දෙක වසා ගෙන ඉඳලා පසුව හෙමිහිට නැගිටලා නැවේ ඩෙක් තට්ටුවට ගියා.

දැන් ඔහුට කිසිවෙක් බාධා කරන්නේ නැහැ. ඩෙක් තට්ටුවේ හිටිය මගීන් පවා වට්ටි, පෙට්ටි සහ මලුවලට හිස තබාගෙන නිදි. නැව යාත්‍රා කරනවා. රළ පහර ගං ඉවුරට වැදෙනවා. මහ රෑ නිහඬතාව නිසා යන්ත්‍රය හුස්ම ගන්නා සැටියක් පවා දැනෙනවා. ඒ යන්ත්‍රයට නැවේ පහළ තට්ටුව ඉඩ මදියි වගේ. සමහර වේලාවට යන්ත්‍රය හැරෙන විට මුළු නැව ම ගැස්සෙනවා. නැවේ ඇණියේ තියෙන සීනුව ඉබේට හැඬවෙනවා.

වලෝද්‍යා ඩෙක් තට්ටුවේ උඩ සිට පහළට බැස්සා. නැවේ මැද හරියට ආවා. එතැන මහ යෝධ කළු පාට බටයක් තියෙනවා. මෙහි රස්නය වැඩියි. මෙහි හැම දෙයක් ම ද, පඩිපෙළේ වැට ද රත් වෙලා. හිටි හැටියේ වලෝද්‍යාට ආලෝකයක් පෙනුණා. එම ආලෝකය ආවේ පහළ විවෘත කරලා තිබුණු ගරාදි වැටකින්.

ඔහු දෙපයේ ඇඟිලි තුඩුවලින් සිට ගෙන පහළ බැලුවා. යන්ත්‍රයේ ඉහළට ඇදී ආ වාෂ්ප කොතරම් උණුසුම් ද යත්, හිසකේ පවා කෙළින් හිටියා. ඒ තමයි යන්ත්‍රය හුස්ම ගන්නා සැටි. බිය මැඩ ගෙන වලෝද්‍යා යන්ත්‍රය දෙස බැලුවා. යන්ත්‍රය ළිඳක් වැනි ගැඹුරු වළක තියෙනවා. එය විශාලයි, අළුපාටයි. අලියෙකුටත් වඩා විශාලයි. එහි විශාල වානේ රිටි හඬ නගමින් එහාට මෙහාට ක්‍රියාකාරී වෙනවා. එයින් හඬක් පිට වෙනවා.

එය තමයි නැවේ ප්‍රධාන බලවේගය.





යන්ත්‍රය නැව ඇද ගෙන යන්නේ කොහොම ද, යන්න මුල දී වලෝද්‍යාට තේරුම් ගන්නට බැරි වුණා. යන්ත්‍රය අසල තෙල් තැවරිච්ච කබායක් ඇඳගෙන, තොප්පියක් හිස පැළඳගෙන මිනිහෙක් ඉන්න හැටි වලෝද්‍යා දැක්කා. ඔහුගේ එක් අතක දිග හොඬක් වගේ අණ්ඩක් සහිත තෙල් පෝච්චිය තිබුණා. අනිත් අතේ තෙල් තැවරිච්ච රෙදි කෑල්ලක්.

ඒ මිනිහා යන්ත්‍රයට තෙල් වත් කළා. පසුව අමතර තෙල් බින්දු පරෙස්සමින් පිස දැම්මා. වැඩිය හොඳින් යන්ත්‍රය දෙස බැලීමට වලෝද්‍යා යකඩ දොරට හේත්තු වුණ හැටියේ ම දොරින් හඬක් පිට වුණා. එවිට යන්ත්‍රය අසල සිටි මිනිහා හිස ඔසවා බැලුවා. ඔහුගේ මුහුණ ඩාදියෙන් නැහැවිලා. එයාට බොහොම රස්නය දැනෙනවා.

නැවේ මගීන් සියලු දෙනා ම නිදා සිටින මැදියම් රාත්‍රියේ කවුදෝ ළමයකු ඇවිත් යන්ත්‍රය දෙස බලන නිසා ඒ යන්ත්‍රයේ අයිතිකරුවා කෝප වුණේ නැහැ.

ඔහු වලෝද්‍යා දෙස කරුණාවෙන් බලා හිස වැනුවා.

ඔහු විහිළුවට වගේ යන්ත්‍රයට සෙමින් තට්ටු කරලා, යන්ත්‍රය ඔහුට කීකරු බව පෙන්වා යමක් කීවා.

එහෙත් යන්ත්‍රය නගන මහා විශාල හඬ නිසා ඔහු කී දේ වලෝද්‍යාට ඇහුණේ නැහැ.

"ඔබ කවුද?" වලෝද්‍යා ඇසුවා.

"එයා තමයි යන්ත්‍රාගාරයේ ශිල්පියා" එහෙම කීවේ වලෝද්‍යාගේ අයියා සාෂා. මල්ලී මහ රෑ නැගිට ගෙන යන්නේ කොහිද කියලා සොයා බැලීමට සාෂා ඔහු පසුපසින් ගියා.

"අයියේ ඔන්න බලන්න එයාගේ හැටි කොහොමද?" වලෝද්‍යා ඔහුගේ කට සාෂාගේ කන ළඟට තබා කීවා. ප්‍රීතියෙන් ඉන්න නිර්භය ශිල්පියාව ඔහුට පෙන්නුවා. "මම ඔහුව සොයා ගත්තා!"

"ප්‍රධාන මිනිසාව සොයා ගත්තා ද? ඉතා ම අනර්ඝයි! දැන් ඉතින් ගිහින් නිදා ගන්න!" අයියා මල්ලීගේ අතින් ඇද්දා.

වලෝද්‍යා විරුද්ධ වුණේ නැහැ. ඔහු දැන් සතුටින්. දැන ගැනීමට ඕන දේ ඔහු දැන ගත්තා. තනිව ම දැන ගත්තා.



# පා සටහන්

දවසක් දා වලෝද්‍යා සහ ඔහුගේ අයියා කැලෑවක් මැදින් ගමන් කළා. ඔවුන් වෙනත් මිනිහකුගේ අඩි පාරක් දිගේ තමයි පා නැගුවේ. මිනිහාගේ පයට පෑගුණු තණ පත්වලට උඩින් වෙනත් කොළ වර්ග වැටිලා තිබුණා. සමහර වේලාවට ඒ අඩි පාර සොයා ගැනීමට වෙනත් සලකුණු සෙවීමට මේ දෙදෙනාට සිද්ද වුණා. පිරිසිදු දිය උල්පතක් අසල ලීයෙන් හදාපු භාජනයක් තිබුණා. පවිත්‍ර ජලය පානය කළ හැකි ය. දිය පාරක් හරහා දඬු දෙකක් දමා ඇත. ඒ නිසා සපත්තු තෙමා ගන්නේ නැතුව යාමට පුළුවනි. විශාල ඕක් ගසක කඩා වැටෙන අත්තක් ගලවා දමා තියෙන නිසා එතැනින් අනතුරකට මූණ නොපා යන්නට හැකි ය.

වලෝද්‍යාගේ අයියා සාෂා මූණ ඇඹුල් කරගත්තා. වනාරක්ෂකයාගේ ගෙදරට යන කෙටි පාර සොයා යාමට පටන් ගත්තා. උල්‍යානොවිලාගේ පවුලේ හැම දෙනා ම වනාරක්ෂකයාගේ ගෙදරට ආවේ එහි සිට කැලෑවේ බිම්මල් එකතු කිරීමට ය. අයියයි, මල්ලියි කැලෑවේ වල්මත් වුණා.

"අපට කොහොම හරි පාර හොයා ගන්නට පුළුවනි. මල්ලී පුංචි නිසා එයා මහන්සි වේවි" අයියා මල්ලි දෙස බලා කල්පනා කළා.

ඒ කැලෑවේ මහා විශාල ගස් නිසා තදබදයක් දැනුණා. ඩාදිය වගුරුවා ගෙන සිටිය පුංචි වලෝද්යා මඳ සිනා පෑවා. අයියා මවිත වුණේ මල්ලි විඩා නොවූ නිසා ය.

"මල්ලි සතුටු වන්නේ මක්නිසා ද? සතුටු වීමට හේතු මොනවා ද?" සාෂා ඇසුවා.

"අයියා කිසි දෙයක් ගැන ගණන් ගත්තේ නැද්ද?" වලෝද්යා ඇසුවේ ප්‍රීතිය පිරි ඇස්වලින් බලමින් ය. "හොඳ මනුස්සයෙක් මේ පාර දිගේ ගිහිල්ලා. ඔහු මේ පාරේ යන ගමන් හොඳ දේ කරලා තියෙනවා. එය කොතරම් හොඳ දෙයක් ද!"


අයියා මල්ලිගේ කතාව අසා මවිතයට පත් වුණා. පහළ පන්තියේ ඉගෙන ගන්න මල්ලිට ළාමක නොවන අදහසක් ඇති වුණේ කොහොම ද? එසේ සිතන ගමන් සාෂාට අපහසුවක් දැනුණා. "අපි නිතර මල්ලිලාගේ නුවණ අඩුවෙන් තක්සේරු කරනවා."

අයියා මල්ලිගේ හිස අත ගා ඔහුට ආදරය දැක් වූවා.

"ඉතින් මල්ලියේ ඔහොම තමයි, ජීවිතය ගත කරන්නට ඕනේ යහපත් වැඩ කරලා. යහපත් පා සටහන් ඉතිරි කරන්නට ඕන."

සාෂා කී අදහස වලෝද්යාට බොහොම හොඳින් මතක හිටියා.





# සුහද සිනාව

සෝවියට් ආණ්ඩුවේ නිර්මාතෘ වරයා සහ පීතෘවරයා වූ වී. අයි. ලෙනින් අසනීප වුණා. කම්කරුවෝ, ගොවියෝ, ආකර ශිල්පියෝ ලෙනින්ට ලියුම් ලියලා ඔහුට සුව පැතුවා. ඉක්මනින් සනීප වෙන්නැයි කියලා ඉල්ලා හිටියා. පුංචි ළමයින් ද ලෙනින් ගැන බොහෝ සැලකිලි දැක්වූවා. අනාත ළමා නිවාසයක ළමයි, ඒ ගොල්ලන්ගේ නිවාසයට එන්නැයි කියලා ලෙනින්ට ඇරයුම් කළා. ලෙනින්ට ප්‍රණීත කිරි සහ ඒ ළමයින් වැවූ එළවළුවලින් සංග්‍රහ කරන බව දැන්වූවා.

පයනියර් සමාජයේ ළමයින්ට ලෙනින්ගේ බිරිඳ නදේෂ්දා ක්‍රූප්ස්කයා මැතිනිය ලියුමක් ලියුවා:

"1922 දී වියාත්කාවල පයනියර් සමාජයේ ළමයින් ලෙනින්ට තෑගි බෝග එවලා තිබුණා. ඒ කාලයේ දී ලෙනින් අසනීප වී හිටියා. ඒ තෑගි අතර චිත්‍ර, මල් සහ වෙනත් තෑගි තිබුණා.

මම ඒ තෑගි ලෙනින්ගේ කාමරය ළඟ තියෙන ලොකු ශාලාවේ තැබුවා. ලෙනින් එතැනින් යන විට ඒ තෑගි දෙස බලා සතුටින් මඳ සිනා පෑවා."

ලෙනින් ජීවත් වූ නිවාසය කෞතුකාගාරයක් බවට පත් වුණා. අපි ඒ කෞතුකාගාරයට පයනියර් ළමයින් සමග ගියා. ළමයින් ඒ තෑගි දෙස බැලුවා. සමහරු හිනා වුණා. ඒ තෑගි බොහොමයක් චාම්, ඒ වගේ ම දුප්පත්. ඇල්බම් පොතක් බැඳලා තිබුණේ පැදුරු වියන පන් වර්ගයකින්. එක පයනියර් ළමයෙක් මෙහෙම කීවා:

"ලෙනින් හිනා වුණේ මොකද කියල මම තේරුම් ගත්තා. මේ වගේ චාම් තෑගි දිහා බැලුවා ම හිනා යනවා!"

ඒ කතාව වැරදියි. ඒ ළමයාට වැරදුණා. නදේෂ්දා මැතිනිය කීවා. ලෙනින් මඳ සිනා පෑවේ එයා තෑගි නිසා සතුටක් ලබාපු හින්දා. අදක්ෂ විදිහට ඒවා හදලා තිබුණත්, ඒවා ළමයින් විසින් ම සෑදූ නිසා ලෙනින් බොහොම සතුටු වුණා.

වෙළෙඳ ශාලාවල ලස්සන, ඒ වගේ ම වටිනා තෑගි විකිණීමට තිබේ. නමුත් මේ ළමයින් තමන්ගේ ශ්‍රමය වැය කරලා හදාපු තෑගි මුදල්වලට ගන්නට බැහැ. ළමයි ලෙනින් කෙරෙහි ඇති ආදරය ක්‍රියාවෙන් පෙන්වා තිබුණා.

සාර් රජ්ජුරුවන්ගේ කාලේ දී හිරකරුවන්ව පිටුවහල් කරපු ඉතා ඈත පෙදෙසක් වන වියාත්කාවල පයනියර් සංගමයේ ළමයි දැන් රතු කර පටි පැළඳ ලෙනින්ව ආදරයෙන් සිහි කරමින්, ඔහු ගැන මතක් කරමින් ඔහුගේ ව්‍යාපාරයට ගරු කරන බව ඒ ළමයින්ගේ තෑගිවලින් පෙනුණා.






වියාත්කාවල ළමයින් චාම් තෑගි සමග එවූ ලියුමක් නිසා ලෙනින් බොහොම සතුටු වුණා.

මේ ළමයින් අතරට රටට ආදරය කරන නියම දේශප්‍රේමීන් ඇති වෙතියි කියලා ලෙනින් විශ්වාස කළා.

“ආදරණීය ලෙනින් සීයා වෙත!

අපි සීයාගේ නමින් ඇති අනාත දරු නිවසේ ඉගෙන ගන්නා ළමයින් වෙමු. අපේ දෙමාපියන් නිර්ධන පංතියට අයත්ව හිටියා. සීයාගේ උපදෙස් අනුගමනය කිරීමට අපි උත්සාහ දරමු. වැඩ කරන ජනතාවගේ සැපත සඳහාත්, පුංචි අපගේ වාසනාව සඳහාත් සීයා ලොකු අරගලයක් ගෙන ගියා. ලෝකයේ ඉතා ම සාධාරණ වාසනාවත් සමාජය ගොඩනැඟීමට සීයා පටන් ගත් වැඩ සපුරාලීම පිණිස ලොකු වුණා ම අපත් ක්‍රියා කරනවා...”



# ප්‍රහේලිකාව

ලෙනින් ඔහුගේ මිතුරන්ට, සගයින්ට, දෙමාපියන්ට, සහෝදර සහෝදරියන්ට, කම්කරුවන්ට සහ ගොවීන්ට ලියූ ලියුම් එකට එක්කාසු කරලා මොස්කව් නගරයේ විශාල මන්දිරයක තබා ඇත. ඒවා දැන් රජය සතු දේ ය.

මේ ලියුම් ගැන උගත් පණ්ඩිතයෝ සැලකිලි දක්වති. ලෙනින් මේ ලියුම් ලියුවේ කාට ද, කුමක් සඳහා ද ආදී තොරතුරු දැන් එක් රැස් කරලා තියෙනවා.

එහෙත් මේ ලියුම් අතර එක් අපූරු ලියුමක් ඇත. එය ලස්සන චිත්‍රයකට සමාන ය. බර්ච් ගහක පට්ටයක කළු තීන්තෙන් එහි රූප ඇඳලා තිබේ. මෙහි අකුරු වෙනුවට මිනිසුන්, සතුන්, ගස් ආදිය ඇඳ ඇත.

වලෝද්යා උල්යානොව්ට වයස අවුරුදු 12 දී ඔහු ඇඳපු චිත්‍ර ලියුමකි, එය. ඔහු සමග එක පංතියේ ඉගෙන ගත් බරිස් පර්මකොව්ස්කිට යැවුවකි. බරිස් ඔහුගේ දෙමාපියන් සමග සිම්බිර්ස්ක් සිට ඔරෙන්බුර්ග්වලට ගිය කාලයේ දී මෙය ලියා ඇත.

පාසල් මිතුරන් දෙදෙන වෙන් වී යන විට, ඇමෙරිකාවේ රතු ඉන්දියන්වරුන් මෙන් චිත්‍රවලින් අදහස් හුවමාරු කර ගැනීමට මේ දෙදෙනා තීරණය කර ගත්තා විය හැක. ඒ දෙදෙනාට වෙන් වූ ළමා රහස් තියෙන්නට ඇති.

උල්යානොව්ලා සහ පර්මකොව්ස්කිලා අතර ඇති වූ ලියුම් ගනුදෙනුවේ දී ලියන ලද ලිපි හා ලියුම් අතර මේ චිත්‍ර ලියුම ද තිබී සොයා ගන්නා ලදි. වලෝද්යාගේ පියා ඒ චිත්‍ර ලියුම පර්මකොව්ස්කිලාට යවමින් මෙසේ ලියා ඇත. "වලෝද්යා බරිස්ගෙන් ලියුමක් බලාපොරොත්තුවෙන් සිටී. ඔබගේ පුතා එවන් ලියුමක් ලියන බවට පොරොන්දු වී ඇත."

මේ චිත්‍ර ලියුමේ අරුත් බොහෝ කලක් තිස්සේ දැන ගැනීමට නොහැකි විය. තාක්ෂණික විද්‍යාව පිළිබඳ ආචාර්ය වී. ඉස්ත්‍රින් එහි තේරුම් සෙවීමට ඉදිරිපත් විය. පුරාණයේ රතු ඉන්දියන්වරුන් චිත්‍ර මගින් ලියුම් ලියා ඇති අතර ඒවායේ අරුත් අනුව ආචාර්ය වරයා වලෝද්යා ලියූ ලියුම් තේරුම් කළේ ය. සමචාරය, මාන කොකා, ගංගාව, ගෙම්බා ආදී සලකුණු එවකට පාසල් මිතුරන් අතර හැඳින් වුණු විකට නම් ලෙස හැඳින්විය හැකි යැයි ඉස්ත්‍රින් ආචාර්යවරයා කල්පනා කරයි. ඒ රූපවල පොකුණක් තුළ සිටින කළු යටි රැවුලක් ඇති මිනිසා දක්වා ඇඳ තිබෙන ඉරිවලින් පෙනී යන්නේ මේ හය දෙනා ම තම ඉල්ලීම් ඔහු වෙත ඉදිරිපත් කර ඇති බව ය. ළමයින් හය දෙනා ඔහුගෙන් ඉල්ලා සිටින්නේ මොනවා ද?

දඩයම් කිරීමේ ක්‍රීඩාවෙන් පසු (එම චිත්‍රයේ පහළ කොටසේ තුවක්කු ගත් හය දෙනකුගේ ද, වලසකුගේ ද, අහසේ පියාඹන කුරුල්ලන්ගේ ද චිත්‍ර ඇත. ඒ අසල කටවල් ඇර ගත් රූප කොල්බසා නමැති මස් කෑලි කෑමට සූදානම් බවක් පෙන්වයි. ඔවුන් අසල වතුර බඳුනක් සහ ආහාර පිඟානක් ද ඇත) ළමයින් වැඩිහිටි මිනිසාට මෙසේ කියන සැටියකි. "පේනවා නේ ද අපට බඩගිනියි. ඉක්මනට ජලස්නානය කිරීම නවත්වා ගෙදර ඇවිත් අපට කෑම දෙන්න." ඒ ළමයිනට කෑම නොදුන්නොත් මොනවා වේවි ද? ඒ ගැන දකුණු කොටසේ ඉහළ ඇති රූපයෙන් මෙසේ කියැවේ. "අපට කෑම නොදුන්නොත් අප මැරිලා යාවි!"

වලෝද්යාගේ චිත්‍ර ලියුමෙන් එසේ කියැවෙන බව පෙන්වා දෙන එම විස්තරය බොහෝ දුරට නිවැරදි යැයි අපට සිතේ.




සී/ස ප්‍රගති ප්‍රකාශන නිවස
91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08

ISBN 978-955-1319-85-4

9 789551 319854

Rs. 200/-